**1 . 32 සංඛ්‍යා සටහන**

**තෝරාගත් ආහාර ද්‍රව්‍යවල සිල්ලර මිළ සාමාන්‍යයන් 1982—1983.**

| ද්‍රව්‍යය | ඒකකය | 1982 රු. | 1983 රු. | වෙනස රුපියල්වලින් 1982-83 | වෙනස ප්‍රතිශතයකින් 1982-83 |
|---|---|---|---|---|---|
| සහල් .. .. | කිලෝඑකක් | 6·56 | 6·92 | 0·36 | 5 |
| උඩරට එළවළු .. .. | ,, | 6·01 | 6·98 | 0·97 | 16 |
| පහතරට එළවළු .. .. | ,, | 4·48 | 5·62 | 1·14 | 25 |
| අලවර්ග .. .. | ,, | 5·60 | 6·58 | 0·98 | 18 |
| මුහුදු මාළු .. .. | ,, | 22·73 | 27·02 | 4·29 | 19 |
| මස් (හරක්, එළු, ඌරු, කුකුළු) .. | ,, | 26·54 | 30·29 | 3·75 | 14 |
| වියළි මිරිස් .. .. | ,, | 30·02 | 32·44 | 2·42 | 8 |
| පොල් .. .. | ගෙඩියක් | 1·57 | 2·23 | 0·66 | 42 |

මූලය : දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙල· ශ්‍රී ලංකා මහ බැංකුව.

වෙනත් ද්‍රව්‍යයන්ගේ සහ සැසඳීමේදී සහල්වල මිළ ඉහළයාම පහළ මට්ටමක පැවතුණි. 1982 සිට සහල් මිළ වැඩිවීමේ වේගයෙහි අඩුවීමක් දක්නට ලැබුණි. පසුගිය අවුරුද්දේ මෙන්ම 1983 දී ද සහල් මිළ වැඩිවූයේ සියයට 5 කින් පමණකි.

පහත රට සහ උඩරට එළවළු දෙවර්ගයේම මිළ පැහැදිලි ලෙස ඉහළ ගිය අතර, උඩරට එළවළු සම්බන්ධයෙන් 1982 වූ සියයට 16 වැඩිවීම මේ වර්ෂයේද ඒ ලෙසම පැවතිණි. 1982 දී සියයට 18 ක් හා ඊටත් පෙර වර්ෂයේ සියයට 9 ක්වූ මිළ වැඩිවීම් හා සසඳා බැලීමේදී මෙම වර්ෂයේ පහතරට එළවළුවල මිළෙහි සියයට 25 ක තියුණු මිළ වැඩිවීමක් විදහා දක්වෙයි. මෙය පහතරට එළවළුවල මිළ වැඩිවීම් වේගවත්වීමේ ප්‍රවනතාවයක් පෙන්නුම් කරයි.

මුහුදු මාළු සහ මස්වල මිළ තියුණු ලෙස වැඩිවුවත්, එම වැඩිවීමේ අනුපාතය, 1982 වර්ෂයේ අනුපාතයට වඩා අඩුය. පසුගිය වර්ෂයේ සියයට 23 හා සසඳන විට මෙම වර්ෂයේ මුහුදු මාළු මිළ වැඩිවූයේ සියයට 19 කින් වූ අතර, ඒ ආකාරයෙන් මස්වල මිළ සාමාන්‍යය වැඩිවූයේ සියයට 16 කින් හා 14 කිනි. වියළි මිරිස් මිළ වාර්තා කළේ සියයට 8 ක මඳ වැඩිවීමකි.

1982 සහ 1983 අතර සියයට 42 වූ වාර්තාගත තියුණුතම මිළ වැඩිවීම වූයේ පොල් මිළෙහිය. මෙය පසුගිය අවුරුද්දේ සිදුවූ සියයට 10 ක මිළ අඩුවීමට ප්‍රතිවිරුද්ධ වූවකි. විශේෂයෙන් පසුගිය දෙමස තුළවූ නිෂ්පාදනයේ ඌනතාවය සහ පොල් නිෂ්පාදන සඳහා වූ අධික අපනයන මිළ මෙම මිළ නැගීමට සාධක වූයේය.

## වැටුප්

1983 වර්ෂයේ දී, සංවිධානය වූ හා සංවිධානය නොවූ යන දෙවැදෑරුම් අංශයන්හිම සේවකයන්ගේ නාමික වැටුප් වැඩිවිය. මෙම වර්ෂයේදී සංවිධානය නොවූ අංශයේ සමහර අනු අංශයන්හි විශේෂයෙන් වී සහ රබර් වගාවන්හි මූල්‍ය වැටුපෙහි වැඩිවීම 1982 වර්ෂයට වඩා වැඩිවිය. සංවිධානය වූ අංශයේ මූල්‍ය වැටුප් වැඩිවීම 1882 වර්ෂයට වඩා අඩු ප්‍රමාණයකින් වූ අතර කොළඹ පාරිභෝගික මිළ දර්ශකයෙන් පෙන්වනු ලබන මිළ වැඩිවීමට මුහුණ දීමට තරම් ප්‍රමාණවත් නොවීය.[1]

1. කොළඹ වැඩකරන පංතියේ වියදම් රටාව මත පදනම් වන කොළඹ පාරිභෝගික මිළ දර්ශකයෙන් අවධමනය කිරීමෙන්, ග්‍රාමීය හා වතු අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප්වල වෙනස්වීම් ගණන් බැලීම කිසිසේත් තත්ත්වානුකූල නොවන බැවින්, සංවිධානය නොවූ පෞද්ගලික අංශයේ මූල්‍ය වැටුප් කොළඹ පාරිභෝගික මිළ දර්ශකයෙන් අවධමනය කිරීමක් නොකෙරිණි.

# වැටුප් ප්‍රමාණ දර්ශක අංක

1978 දෙසැම්බර් = 100

මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

සංවිධානය වූ අංශයේ, පඩි පාලක සභාව මගින් ආවරණය වන පෞද්ගලික අංශයේ සේවකයන්ගේ සහ රජයේ සේවකයන්ගේ මූල්‍ය වැටුප් වැඩිවිය. රාජ්‍ය අංශයේ මූල්‍ය වැටුප් වර්ධනය පෙර වර්ෂ දෙකෙහි මෙන්ම, පෞද්ගලික අංශයේ වර්ධනය ඉක්මවූ අතර, කාණ්ඩ කීපයක හැර 1980 සිට සමාන වර්ධන රටාවක් පෙන්නුම් කළේය. සංවිධානයවූ අංශයේ විවිධ කාණ්ඩ වලට අයත් සේවකයන්ගේ නාමික වැටුප් වර්ධන ප්‍රමාණයන් අංක 1.33 සංඛ්‍යා සටහනෙහි දක්වේ.

**1 . 33 සංඛ්‍යා සටහන**

**සංවිධානය වූ අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශක අංක**

**1978 දෙසැම්බර් = 100**

| සංවිධානය වූ අංශය | වැටුප් ප්‍රමාණ දර්ශකය | | වෙනස ඒකක වලින් | වෙනස ප්‍රතිශතය කින් |
|---|---|---|---|---|
| | 1982 | 1983 | | |
| 1. පඩිපාලක සභාවල නියුතු කම්කරුවන් .. | 175·8 | 188·8 | 13·0 | 6·9 |
| I කෘෂිකර්මයෙහි යෙදී සිටින කම්කරුවන් .. | 181·2 | 198·7 | 17·5 | 9·7 |
| II කර්මාන්තවල හා වාණිජ කටයුතුවල යෙදී සිටින කම්කරුවන් .. | 161·0 | 163·1 | 2·1 | 1·3 |
| III සේවා අංශයේ කම්කරුවන් .. | 169·7 | 177·8 | 8·1 | 4·8 |
| 2. සියළුම රජයේ සේවකයන් .. | 187·8 | 215·7 | 27·9 | 14·9 |
| I සියළු විධායක නොවන නිලධාරීන් .. | 180·6 | 204·6 | 24·0 | 13·3 |
| II සියළු සුළු සේවකයන් .. | 194·7 | 226·2 | 31·5 | 16·2 |
| 3. රජයේ පාසැල් ගුරුවරුන් .. | 166·4 | 188·1 | 21·7 | 13·2 |

මූලයන් : කම්කරු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව.

රජයේ පාසැල් ගුරුවරුන් ඇතුළු රාජ්‍ය අංශයේ සේවකයන් වෙනුවෙන්, ජීවන වියදම් දර්ශකයේ වැඩිවීම් ඒකකයක් සඳහා ගෙවන ලද රු. 2 ක්වූ දීමනාව, 1983 පෙබරවාරි මාසයේ මාසික දීමනාව වූ රු. 140 ක මට්ටමේදී ස්ථායි කරන ලදි. මීට අමතරව, 1983 මාර්තු මාසයේ සිට රු. 1000 කට අඩු මාසික වැටුපක් හෝ විශ්‍රාම වැටුපක් ලබන සෑම අයෙකුටම රු. 100 ක දීමනාවක් ගෙවනු ලැබිණි. සැප්තැම්බර් මාසයේ සිට මෙය රු. 106 වන සේ වැඩි කර, වැටුප් මට්ටම් ප්‍රභේදයකින් තොරව සියළුම රජයේ සේවකයන්ට ලැබෙන පරිදි ගෙවීම් පදනම පුළුල් කරන ලදී. මෙලෙස 1983 සැප්තැම්බර් මාසයේ සිට ජීවන වියදම් දර්ශකයේ වැඩිවීම් වෙනුවෙන් මාසිකව රු. 246 ක් සියළුම රජයේ සේවකයන්ට ගෙවනු ලැබීය.

රජයේ සේවකයන්ගේ සාමාන්‍ය මූල්‍ය වැටුප 1983 වර්ෂයේදී සියයට 15 කින් වැඩි වූ නමුත් මෙය 1982 වර්ෂයට වඩා අඩු ප්‍රමාණයක වර්ධනයක් විය. විධායක නොවන නිලධාරීන් සුළු සේවකයන් හා රජයේ ගුරුවරුන්ගේ වැටුප් පිළිවෙලින් සියයට 13, 16 හා 13 වශයෙන් වැඩිවිය. කෙසේ වුවද, මෙම වර්ධනයන් 1982 වූ වර්ධන ප්‍රමාණයන්ට වඩා අඩු ප්‍රමාණයකින් සිදුවිය. සමස්ථයක් වශයෙන් රාජ්‍ය අංශයේ සියළුම සේවකයන්ගේ සාමාන්‍ය මූර්ත වැටුප් සියයට 0.9 කින් ආන්තිකව වැඩිවිය. මෙය 1982 වර්ෂයේදී සියයට 16 ක් වූ මූර්ත වැටුප් වර්ධනයට වඩා ප්‍රතිවිරුද්ධ වූවකි.[1] 1983 දී විධායක නොවන නිලධාරීන්ගේ හා රජයේ පාසල් ගුරුවරුන්ගේ මූර්ත වැටුප් පිළිවෙලින් සියයට 0.4 කින් හා 0.6 කින් ආන්තිකව වැඩි වූ අතර, සුළු සේවකයින් සඳහා එය සියයට 2 කින් වර්ධනය විය. කෙසේ වුව ද, 1982 වර්ෂය තුළදී මෙම ශ්‍රේණි තුනටම අයත් සේවකයන්ගේ මූර්ත වැටුප්වල වර්ධනයක් ඇතිවිය.

1. 1982 වාර්ෂික වාර්තාවේ සියයට 19 ක වර්ධනයක් දක්වයි. මෙය නිගමනය කරන ලද්දේ 1952 වර්ෂය පදනම් වර්ෂය ලෙස සැළකීමෙනි. (1952=100) 1983 දී දර්ශකය වඩාත් උචිත ලෙස සංශෝධනය කෙරුණු අතර, 1978 වර්ෂය පදනම් වර්ෂය ලෙස ගැණුනි. ((1978=100).

පඩ්පාලක සභාව මගින් ආවරණය වන සංවිධානය වූ පෞද්ගලික අංශයේ 1982 වර්ෂයේදී සියයට 16 ක් වූ සාමාන්‍ය මූල්‍ය වැටුප් වර්ධනය හා සසඳන කල, 1983 දී එය සියයට 7 කින් වර්ධනය විය. 1982 වර්ෂයේ දී සියයට 4 ක් වූ වර්ධනයට ප්‍රතිවිරුද්ධ ලෙස 1983 දී මූර්ත වැටුප් සියයට 6 කින් පහත වැටුණි.

සංවිධානය වූ පෞද්ගලික අංශයේ කර්මාන්ත හා වෙළෙඳ, කෘෂිකර්මය හා සේවාවන්වල නියුතුව සිටින සේවකයන්ගේ නාමික වැටුප් පිළිවෙලින් සියයට 1.3, 10 හා 5 වශයෙන් වැඩිවිය. මෙම වර්ධනයන් 1982 දී වූ වර්ධනයන්ට වඩා අඩුවිය. 1983 වර්ෂයේදී කර්මාන්ත හා වෙළඳ අංශයේ, මූර්ත වැටුප් සියයට 11 කින් පහත වැටුණු අතර, කෘෂිකර්ම අංශයේ හා සේවා අංශයන්හි මූර්ත වැටුප් පිළිවෙලින් සියයට 8 කින් හා 4 කින් පහත වැටුණි. මෙය 1982 වූ මූර්ත වැටුප් වර්ධනයට ප්‍රතිවිරුද්ධ වූවකි.

සංවිධානය නොවූ අංශයේ වැටුප් සංචලනය තීරණය කරනු ලබන්නේ, ශ්‍රී ලංකා මහ බැංකුවේ, දීපව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙල යටතේ ලබා ගන්නා තොරතුරු මතය. මෙම වැඩපිළිවෙල යටතේ විධිමත් පදනමක් මත, වී, පොල්, රබර් සහ තේ වගාවන්හි කුඩා වතු අංශයේ සහ ඉදිකිරීම් අංශයේ නියුතු සේවකයන්ගේ දෛනික වැටුප් තොරතුරු එක්රැස් කරනු ලැබේ.

### 1 . 34 සංඛ්‍යා සටහන

### සංවිධානය නොවූ අංශයෙහි දෛනික වැටුප් සාමාන්‍යයන්

| සංවිධානය නොවූ අංශය | ශ්‍රමිකයා | දෛනික වැටුප් ප්‍රමාණයන් 1982 | දෛනික වැටුප් ප්‍රමාණයන් 1983 | වෙනස රුපියල්වලින් | වෙනස ප්‍රතිශතයකින් |
|---|---|---|---|---|---|
| වී | පිරිමි .. | 30·66 | 36·61 | 5·95 | 19 |
| | ගැහැණු .. | 22·26 | 26·94 | 8·42 | 21 |
| පොල් | පිරිමි .. | 32·39 | 37·78 | 2·26 | 17 |
| | ගැහැණු .. | 18·26 | 21·52 | 3·26 | 18 |
| රබර් | පිරිමි .. | 26·22 | 31·08 | 6·63 | 18 |
| | ගැහැණු .. | 18·88 | 22·30 | 3·42 | 18 |
| තේ | පිරිමි .. | 22·17 | 23·81 | 1·64 | 7 |
| | ගැහැණු .. | 15·86 | 16·78 | 0·92 | 6 |
| වඩු කර්මාන්තය | පිරිමි .. | 53·86 | 59·94 | 6·08 | 11 |
| පෙදරේරු කර්මාන්තය | පිරිමි .. | 52·44 | 58·31 | 5·66 | 11 |

මූලය : දීපව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙල; ශ්‍රී ලංකා මහ බැංකුව.

1983 වර්ෂයේදී සියළුම අනුඅංශයන්හි, මූල්‍ය වැටුප් වැඩිවූ අතර, තියුණුම වර්ධනයක් වූයේ වී හා රබර් අනුඅංශයන්හිය. වී වගාවේ නියුතු ගැහැණු ශ්‍රමිකයන්ගේ දෛනික වැටුප සියයට 21 කින් වැඩි වූ අතර, පිරිමි ශ්‍රමික වැටුප සියයට 19 කින් වැඩිවිය. රබර් වගාවන්හි නියුතු පිරිමි සහ ගැහැණු ශ්‍රමිකයන්ගේ වැටුප සියයට 18 කින් වැඩිවිය. පොල් සහ තේ වගා අංශයන්හි ගැහැණු ශ්‍රමික වැටුප් ප්‍රමාණයන් පිරිමි ශ්‍රමික වැටුප් මෙන් නොව, 1982 වර්ෂයට වඩා ඉහළ අනුපාතයකින් වැඩි විය. ඉදිකිරීම් අංශයේ නියුතු වඩු කාර්මික හා පෙදරේරු වැටුප් 1982 වර්ෂයට වඩා අඩු ප්‍රමාණයකින් වර්ධනය විය. 1982 හා 1983 වර්ෂ තුළදී සිදුවූ වෙනස්වීම් හා සාමාන්‍ය දෛනික වැටුප් ප්‍රමාණයන් 1.34 වැනි සංඛ්‍යා සටහනින් දක්වයි.

### වෙළෙඳාම

ගත වූ වසර කීපය තුළ දියුණු වූ රටවල පැවති ආර්ථික පසුබෑම් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම සහ තේ හා රබර් සඳහා පෙර නොවූ විරු ලෙස මිළ ගණන් වැඩිවීම හේතුකොටගෙන 1983 වසරේ ශ්‍රී ලංකාවේ විදේශීය වෙළෙඳාමෙහි සැළකිය යුතු වර්ධනයක් ඇති විය.

1983 වසරේදී අපනයන ඉපැයීම් විගැහි වටිනාකම් අනුව සියයට 7 කින් වර්ධනය වූ අතර 1977 න් පසු ප්‍රථම වරට ආනයනයන්හි අඩුවීමක් වාර්තා කළේය. මේ මගින් කෙසේ වෙතත්, අසතුටුදායක වූ සමහර උපනතීන් පෙන්නුම් නොකරයි. තේ සහ රබර් මිලෙහි වැඩි වීම නිසා වැවිලි භෝග අංශයෙන් ලත් අපනයන වටිනාකම පසුගිය වර්ෂයට වඩා විශාල වැඩිවීමක්